# 9. පොට්ඨපාදසුත්තං

1. එවං මෙ සුතං: එකං සමයං භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන **පොට්ඨපාදො** පරිබ්බාජකො සමයප්පවාදකෙ **තින්දුකාචීරෙ** එකසාලකෙ **මල්ලිකාය** ආරාමෙ පටිවසති මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං තිංසමත්තෙහි පරිබ්බාජකසතෙහි.

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය සාවත්ථිං පිණ්ඩාය පාවිසි. අථ ඛො භගවතො එතදහොසි: අතිප්පගො ඛො තාව සාවත්ථියං පිණ්ඩාය චරිතුං, යන්නූනාහං යෙන සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය ආරාමො, යෙන පොට්ඨපාදො පරිබ්බාජකො, තෙනුපසඞ්කමෙය්‍යන්ති. අථ ඛො භගවා යෙන සමයප්පවාදකො තින්දුකාචීරො එකසාලකො මල්ලිකාය ආරාමො තෙනුපසඞ්කමි.

3. තෙන ඛො පන සමයෙන පොට්ඨපාදො පරිබ්බාජකො මහතියා පරිබ්බාජකපරිසාය සද්ධිං නිසින්නො හොති උන්නාදිනියා උච්චාසද්දමහාසද්දාය අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්තියා – සෙය්‍යථීදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං ගන්ධකථං මාලාකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං, ඉති වා'ති.

4. අද්දසා ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං දූරතො'ව ආගච්ඡන්තං. දිස්වාන සකං පරිසං සණ්ඨපෙසි:[1] "අප්පසද්දා හොන්තො හොන්තු. මා හොන්තො සද්දමකත්ථ. අයං සමණො ගොතමො ආගච්ඡති. අප්පසද්දකාමො ඛො සො පනායස්මා, අප්පසද්දස්ස වණ්ණවාදී. අප්පෙව නාම අප්පසද්දං පරිසං විදිත්වා උපසඞ්කමිතබ්බං මඤ්ඤෙය්‍යා"ති. එවං වුත්තෙ තෙ පරිබ්බාජකා තුණ්හී අහෙසුං. අථ ඛො භගවා යෙන පොට්ඨපාදො පරිබ්බාජකො තෙනුපසඞ්කමි. අථ ඛො පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: එතු ඛො භන්තෙ භගවා. ස්වාගතං[2] භන්තෙ භගවතො. චිරස්සං ඛො භන්තෙ භගවා ඉමං පරියායමකාසි යදිදං ඉධාගමනාය. නිසීදතු භන්තෙ භගවා. ඉදමාසනං පඤ්ඤත්තන්ති. නිසීදි භගවා පඤ්ඤත්තෙ ආසනෙ. පොට්ඨපාදො'පි ඛො පරිබ්බාජකො අඤ්ඤතරං නීචං ආසනං ගහෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො පොට්ඨපාදං පරිබ්බාජකං භගවා එතදවොච: "කාය නු'ත්ථ පොට්ඨපාද එතරහි කථාය සන්නිසින්නා? කා ච පන වො අන්තරා කථා විප්පකතා?"ති.

---

1. **සණ්ඨාපෙසි,** PTS. 2. **සාගතං,** PTS

# 9. පොට්ඨපාද සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ **සැවැත්**නුවර **දෙව්රම් නම් වූ අනේපිඩුසිටුහු** අරමැ වැඩ වසන සේක. එ සමයෙහි **පොට්ඨපාද** නම් පිරිවැජි තෙම, (බමුණුනිවටු ආදීන් රැස් වැ තමතමන් සමය පවසන හෙයින්) සමයප්‍රවාදක නම් වූ (තිඹිරිරුක්පෙළින් පිරිකෙවුණු හෙයින්) **තිණ්ඩුකාචීර** නම් වූ (පළමු එක් හලක් ම වූ තැන බැවින්) එකශාලක නම් වූ, **මල්ලිකා** දෙවියගේ උයනෙහි, පිරිවැජියන් තුන්දහසක් පමණ වූ මහ පිරිවැජි පිරිසක් හා වෙසෙයි.

2. එ කල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු වේලෙහි හැදැ පෙරෙවැ පිඩු පිණිස සැවැත් නුවර පිවිසි සේක. එ විටැ "සැවැතෙහි පිඩු පිණිස හැසිරෙනුවට තව මැ ඉතා උදැසන සැ. ඉදින් මම් සමයප්‍රවාදක තිණ්ඩුකාචීර එකශාලක නම් වූ මල්ලිකාරාමය කරා, පොට්ඨපාද පිරිවැජි වෙත ගියෙම් නම් යෙහෙකැ"යි භාග්‍යවතුන් වහන්සේට මේ සිත විය. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ... ඒ මල්ලිකාරාමය කරා වැඩි සේක.

3. එ සමයෙහි පොට්ඨපාද පිරිවැජි තෙම - රාජකථා චෞරකථා මහාමාත්‍රකථා සේනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වස්ත්‍රකථා ශයනකථා ගන්ධකථා මාලාකථා ඥාතිකථා යානකථා ග්‍රාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ස්ත්‍රීකථා පුරුෂකථා ශූරකථා විසිඛාකථා කුම්භස්ථානකථා පූර්වප්‍රේතකථා ලොකාඛ්‍යායිකා සමුද්‍රාඛ්‍යායිකා ඉතිභවාභවකථා යන මේ හෝ මෙයින් අන්‍ය වූ මෙබඳු නොයෙක් වැදෑරුම් තිරිසන්කථා කියන, ඝෝෂවත් වූ, උස් හඬ මහහඬ ඇති මහපිරිවැජි-පිරිස සඟ හුන්නේ වෙයි.

4. පොට්ඨපාද පිරිවැජි තෙම දුරින් ම වඩනා භාග්‍යවතුන් වහන්සේ දුටුයේ ය. දැක, "භවත්හු නිහඬ වෙත් වා. භවත්නි, හඬ නො කරවු. මේ මහණ ගොයුම් එයි. ඒ ආයුෂ්මත් තෙම නිහඬබව කැමැත්තේ ය. නිහඬබවෙහි ගුණ කියන සුලු ය. පිරිස නිහඬ සේ දැන එළැඹියැ යුතු කොට සිතුවොත් යෙහෙකැ"යි සිය පිරිස සංහුන් කෙළේ ය. මෙසේ ඔහු කී කලැ ඒ පිරිවැජියෝ නිහඬ වූහ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ පොට්ඨපාද පිරිවැජියා කරා එළැඹි සේක. එ කල්හි පොට්ඨපාද පිරිවැජි තෙම භාග්‍යවතුන් වහන්සේට, "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක් වා. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වැඩි සේ යහපත. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩනට කලෙකින් පසු මේ අවස්ථාව ලත් සේක් වන. වහන්ස, භාග්‍යවතුන් වහන්සේගේ ශුභාගමනයෙකි. මේ අස්නෙක් පනවන ලදැ"යි කී ය. පනවන ලද අස්නෙහි භාග්‍යවතුන් වහන්සේ වැඩ හුන් සේක. පොට්ඨපාද පිරිවැජි ද එක්තරා මිටි අස්නක් ගෙන එක් පසෙක හුන්නේ ය. එක් පසෙක හුන් පොට්ඨපාද පිරිවැජියාට "පොට්ඨපාදයිනි, මෙහි දැන් තෙපි කවර නම් කථායෙකින් හුන්නහු ද? මා එන්නාට පෙර මා එන තෙක් මේ අතර තොපගේ කිනම් කථාවෙක් අඩාල වී ද?"යි අසාවදාල සේක.

5. එවං වුත්තෙ පොට්ඨපාදො පරිබ්බාජකො භගවන්තං එතදවොච: තිට්ඨතෙසා භන්තෙ කථා, යාය මයං එතරහි කථාය සන්නිසින්නා. නෙසා භන්තෙ කථා භගවතො දුල්ලභා භවිස්සති පච්ඡාපි සවණාය. පුරිමානි භන්තෙ දිවසානි පුරිමතරානි නානාතිත්ථියානං සමණබ්‍රාහ්මණානං කුතුහලසාලාය සන්නිසින්නානං සන්නිපතිතානං අභිසඤ්ඤානිරොධෙ කථා උදපාදි "කථං නු ඛො භො අභිසඤ්ඤානිරොධො හොතී?"ති.

(1) තත්‍රෙකච්චෙ එවමාහංසු: "අහෙතු අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. යස්මිං සමයෙ උප්පජ්ජන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ නිරුජ්ඣන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොතී"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

(2) තමඤ්ඤො එවමාහ: "න ඛො පන මෙ'තං භො එවං භවිස්සති. සඤ්ඤා හි භො පුරිසස්ස අත්තා. සා ච ඛො උපෙති'පි අපෙති'පි. යස්මිං සමයෙ උපෙති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපෙති, අසඤ්ඤී තස්මිං සමයෙ හොතී"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤ-පෙන්ති.

(3) තමඤ්ඤො එවමාහ: "න ඛො පන මෙ'තං භො එවං භවිස්සති. සන්ති හි භො සමණබ්‍රාහ්මණා මහිද්ධිකා මහානුභාවා. තෙ ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපකඩ්ඪන්ති. අසඤ්ඤී තස්මිං සමයෙ හොතී"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

(4) තමඤ්ඤො එවමාහ: "න ඛො පන මෙ'තං භො එවං භවිස්සති. සන්ති හි භො දෙවතා[3] මහිද්ධිකා මහානුභාවා. තා ඉමස්ස පුරිසස්ස සඤ්ඤං උපකඩ්ඪන්ති'පි අපකඩ්ඪන්ති'පි. යස්මිං සමයෙ උපකඩ්ඪන්ති, සඤ්ඤී තස්මිං සමයෙ හොති. යස්මිං සමයෙ අපකඩ්ඪන්ති, අසඤ්ඤී තස්මිං සමයෙ හොතී"ති ඉත්ථෙකෙ අභිසඤ්ඤානිරොධං පඤ්ඤපෙන්ති.

6. තස්ස මය්හං භන්තෙ භගවන්තං යෙව ආරබ්භ සති උදපාදි: 'අහො නූන භගවා, අහො නූන සුගතො, යො ඉමෙසං ධම්මානං සුකුසලො'ති. භගවා භන්තෙ කුසලො භගවා පකතඤ්ඤූ අභිසඤ්ඤා-නිරොධස්ස. කථං නු ඛො භන්තෙ අභිසඤ්ඤානිරොධො හොතී?"ති.

---

1. පඤ්ඤාපෙන්ති, PTS. 2. න ඛො නාමෙතං, PTS.
3. දෙවා, සයාම. 4. තෙ, සයාම.

5. මෙසේ වදාළ කල්හි පොට්ඨපාද පිරිවැජි භාග්‍යවතුන් වහන්සේට මෙය කීය: "වහන්ස, යම් කථාවෙකින් අපි මෙහි හුන්නමෝ නම්, ඒ කථාව තිබේවා. වහන්ස, ඒ කථාව පසුව ද භාග්‍යවතුන් වහන්සේට අසන්නට දුර්ලභ නො වෙයි. පුරිම පුරිමතර දවස්හි (බොහෝ කලකට පෙරැ) කුතුහලශාලායෙහි එක් ව හුන් එක් රැස් වූ මහණ බමුණන් අතරැ "භවත්නි, අභිසංඥානිරෝධය (චිත්තනිරෝධය, ක්ෂණිකනිරෝධය) කෙසේ නම් වේ ද?"යි අභිසංඥානිරෝධයෙහි කථාවෙක් පහළ විය.

(1) එහි ඇතැම්හු "හෙතු නැති ව ප්‍රත්‍යය නැති ව පුරිස්හට සංඥාවෝ උපදනාහු ද නිරුද්ධ වන්නාහු ද වෙත්. යම් විටෙක ඔහු උපදනාහු ද, එ විටැ හේ සංඥී (සංඥා ඇත්තේ) වෙයි. යම් විටෙක සංඥාවෝ නිරුද්ධ වන්නාහු ද, එ විටැ හේ අසංඥී වේ" යැ යි මෙසේ කිහ. මෙසේ ඇතැම් කෙනෙක් අභිසංඥානිරෝධය (චිත්තනිරෝධය) පණවත්.

(2) ඔහුට අනෙකෙක්, "භවත, මට මෙය මෙසේ නො වන්නේ ය. (මගේ දැනීම මෙසේ නො වන්නේ ය.) භවත, සංඥාව පුරුෂයාගේ ආත්මය ය. එ ද එළැඹෙන්නේත් වෙයි. ඉවත් ව යන්නේත් වෙයි. යම් කලෙක එය එළැඹේ ද, එ කලැ හේ සංඥී වෙයි. යම් කලෙක පහ වැ යේ ද, එ කලැ අසංඥී වේ යැ"යි මෙසේ කී ය. මෙසේ ඇතැම් කෙනෙක් අභිසඤ්ඤානිරෝධය පණවත්.

(3) ඔහුට අනෙකෙක් භවත, මට මෙය මෙසේ නො වන්නේ ය. භවත, මහත් සෘද්ධි ඇති මහත් අනුභාව ඇති මහණ බමුණු කෙනෙක් වෙත් ම ය. ඔහු මේ පුරුෂයාට සංඥාව පමුණුවත්නෝ ද වෙති. ඔහුගේ සංඥාව ඉවතට අදනෝ ද වෙති. යම් විටෙක ඔහු කරා සංඥාව පමුණුවත් නම්, එ විටැ හෙ තෙම සංඥී වෙයි. යම් විටෙක සංඥාව ඉවතට අදනාහු නම්, එ විටැ අසංඥී වේ" යැ යි කී ය. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්.

(4) ඔහුට අනෙකෙක්, "භවත, මෙය මට මෙසේ නො වන්නේ ය. භවත, මහත් සෘද්ධි ඇති, මහත් අනුභාව ඇති, දෙවතා කෙනෙක් ඇත. ඔහු මේ පුරුෂයා වෙතට සංඥාව පමුණුවන්නෝ ද, මොහුගෙන් ඉවතට අදනෝ ද වෙත්. යම් විටෙක සංඥාව මොහු වෙතට පමුණුවත් ද, එ විටැ මෙ තෙම සංඥී වෙයි. යම් විටෙක එය මොහුගෙන් ඉවතට අදිත් ද, එ විටැ අසංඥී වෙයි. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්" යැ යි කී ය. මෙසේ ඇතැම්හු අභිසංඥානිරෝධය පණවත්.

6. වහන්ස, "යම් කෙනෙක් මේ දහම්හි නිපුණ ද ඒ භාග්‍යවතුන් වහන්සේ අහෝ මෙය පවසන සේක් නම් ඉතා මැනැව නු. ඒ සුගතයන් වහන්සේ මෙය වදාරන සේක් නම් ඉතා මැනැව නො."යි (එ වේලෙහි) මට භාග්‍යවතුන් වහන්සේ ම ඇරැබ සිහිය උපන. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අභිසංඥානිරෝධයෙහි නිපුණ සේක. ඇති සැටිය (ප්‍රකෘතිය) දන්නා සේක. වහන්ස, අභිසංඥානිරෝධය කෙසේ වේ ද?".

7 තත්‍ර පොට්ඨපාද යෙ තෙ සමණබ්‍රාහ්මණා එවමාහංසු: අහෙතූ අප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්තිපී'ති. ආදිතො'ව තෙසං අපරද්ධං. තං කිස්ස හෙතු? සහෙතූ හි පොට්ඨපාද සප්පච්චයා පුරිසස්ස සඤ්ඤා උප්පජ්ජන්ති'පි නිරුජ්ඣන්ති'පි. සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජන්ති, සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣන්ති''.

''කා ච සික්ඛා''ති භගවා අවොච:

ඉධ පොට්ඨපාද තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා. සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං, සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං. බ්‍රහ්මචරියං පකාසෙති.

8. තං ධම්මං සුණාති ගහපති වා ගහපතිපුත්තො වා අඤ්ඤතරස්මිං වා කුලෙ පච්චාජාතො. සො තං ධම්මං සුත්වා තථාගතෙ සද්ධං පටිලභති. සො තෙන සද්ධාපටිලාභෙන සමන්නාගතො ඉති පටිසංචික්ඛති: ''සම්බාධො ඝරාවාසො රජොපථො[1], අබ්භොකාසො පබ්බජ්ජා. න ඉදං සුකරං අගාරං අජ්ඣාවසතා එකන්තපරිපුණ්ණං එකන්තපරිසුද්ධං සඞ්ඛලිඛිතං බ්‍රහ්මචරියං චරිතුං. යන්නූනාහං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජෙය්‍යන්ති''.

9. සො අපරෙන සමයෙන අප්පං වා භොගක්ඛන්ධං පහාය මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං වා ඤාතිපරිවට්ටං පහාය මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති. සො එවං පබ්බජිතො සමානො පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී. සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, කායකම්මවචීකම්මෙන සමන්නාගතො කුසලෙන, පරිසුද්ධාජීවො සීලසම්පන්නො ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො භොජනෙ මත්තඤ්ඤූ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො සන්තුට්ඨො.

10. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො නිහිතසත්ථො -පෙ-

---

1. රජාපථො, සයාම.

7. පොට්ඨපාදය, එහි යම් මහණ බමුණු කෙනෙක් "හෙතු නැති ව, ප්‍රත්‍යය නැති ව පුරුෂයාට සංඥාවෝ උපදිති යි ද නිරුද්ධ වෙති" යි ද මෙසේ කීහු නම්, මුලින් ම ඔවුනට වැරැදිණ. ඒ කවර හෙයින ? පොට්ඨපාදය, පුරිස්නට හෙතුසහිත ව ම ප්‍රත්‍යය සහිත ව ම (කරුණු සහිත ව ම) සංඥාවෝ උපදනෝත් නිරුද්ධ වන්නෝත් වෙති. ශික්ෂායෙන් ඇතැම් සංඥාවෝ උපදිත්. ශික්ෂායෙන් ඇතැම් සංඥාවෝ නිරුද්ධ වෙත්".

"ඒ කවර ශික්ෂාවෙක් ද ?" යි භාග්‍යවතුන් වහන්සේ ම (ප්‍රශ්න කොට එය විස්තර කරන සේක් මතු දක්වෙන ධර්මකථාව) වදාළ සේක:

පොට්ඨපාදය, මෙහි රහත් වූ සම්මාසම්බුදු වූ විද්‍යාචරණසම්පන්න වූ සුගත වූ ලොකඥ වූ නිරුත්තර පුරුෂදම්‍යසාරථි වූ දෙව්මිනිස්නට ශාස්තෘ වූ සිවුසස් අවබොධ කළා වූ භගවත් වූ තථාගත තෙමේ ලොවැ පහළ වෙයි. හේ දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මෙ ලොව ද, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත සත්මුළුව ද තෙමේ විශිෂ්ට වූ නුවණින් දැන පසක් කොට ඔවුනට අවබොධ කරවයි. හේ ආදියෙහි හද්‍ර කොට මධ්‍යයෙහි හද්‍ර කොට අවසන්හි හද්‍ර කොට අර්ථ සහිත කොට ව්‍යංජන සහිත කොට සර්වප්‍රකාරයෙන් පරිපූර්ණ කොට පිරිසිදු කොට දහම් දෙසයි. (ඒ දෙසනුයේ ද) ශාසනබ්‍රහ්මචය්‍ර්‍යය හෙළි කෙරෙයි.

8. ගැහැවියෙක් හෝ ගැහැවිපුතෙක් හෝ අන් එක්තරා කුලයෙකැ උපන්නෙක් හෝ ඒ දහම් අසයි. හේ ඒ දහම් අසා තථාගත බුදුහු කෙරෙහි සැදැහැ පිළිලබයි (උපදවයි). හේ ඒ සැදැහැ පිළිලැබීමෙන් යුත් වූයේ, "ගෘහවාසය සම්බාධයෙකි රජස්පථයෙකි. පැවිද්ද අභ්‍යවකාශය වැන්න. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් පිරිපුන් කොට එකාන්තයෙන් පිරිසිදු කොට ශඞ්ඛලිඛිතයක් සේ කොට මේ සසුන්-බඹසර පුරන්නට පහසු නොවේ. මම් කෙහෙරවුලු බහවා කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් පැවිදිබිම් වදනෙම් වීම් නම් යෙහෙකැ" යි මෙසේ නුවණින් සලකයි.

9. හේ පසු කලෙක මඳ වූ හෝ මහත් වූ හෝ සම්පත් රැස හැරැ, මඳ වූ හෝ මහත් වූ හෝ නෑපිරිස හැරැ, කෙහෙරවුලු බහවා, කසාවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් පැවිදිබිම් වදී. හේ මෙසේ පැවිදි වූයේ ම ප්‍රාතිමොක්ෂසංවරයෙන් සමන්විත වූයේ, ආචාරගොචර දෙකින් යුත් වූයේ, අණු පමණ වූ ද වරදෙහි බිය දක්නේ, නිවරද කායවාක්කර්මයෙන් යුක්ත වූයේ එහෙයින් ම පිරිසිදු ආජීවය ඇත්තේ, සිල්වත් වූයේ, ඉඳුරන්හි වැසූ දොරැතියේ, බොජුන්හි පමණ දත්තේ, සිහිනුවණින් යුත් වූයේ, පසයෙහි තුන් සතුටින් සතුටු වූයේ, සික‍පද සමාදන් කොට ගෙන හික්මෙයි.

10. පොට්ඨපාදය, මහණ තෙම කෙසේ නම් සිල්වත් වේ ද යත්: පොට්ඨපාදය, මෙහි මහණ තෙම පණිවා හැරැ පණිවායෙන් වැළැක්කේ වෙයි. බහා තැබූ දඬුමුගුරු ඇත්තේ, බහා තැබූ අවි ඇත්තේ...

අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො හොති -පෙ- අබ්‍රහ්මචරියං පහාය බ්‍රහ්මචාරී හොති -පෙ- මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති -පෙ- පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො හොති -පෙ- ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති -පෙ- සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති -පෙ-, ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

11. බීජගාමභූතගාමසමාරම්භා පටිවිරතො හොති -පෙ- ඡෙදනවධබන්ධනවිපරාමොසආලොපසහසාකාරා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

12. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: නච්චං ගීතං -පෙ- අණීකදස්සනං. ඉති වා ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. ඉදම්පිස්ස හොති සීලස්මිං.

13. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං ජූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: අට්ඨපදං දසපදං -පෙ- යථාවජ්ජං. ඉති වා ඉති එවරූපා ජූතප්පමාදට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

14. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං උච්චාසයනමහාසයනං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: ආසන්දිං පල්ලඞ්කං -පෙ- උභතොලොහිතකූපධානං. ඉති වා ඉති එවරූපා උච්චාසයනමහාසයනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

15. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- මණ්ඩනවිභූසනට්ඨානානුයොගං අනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: උච්ඡාදනං පරිමද්දනං -පෙ- ඔදාතානි වත්ථානි දීඝදසානි. ඉති වා ඉති එවරූපා මණ්ඩනවිභූසනට්ඨානානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

16. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං තිරච්ඡානකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

අසිනාදන් හැර අසිනාදනින් වැළැක්කේ වෙයි... අබ්‍රම්සර හැර බඹසැරි වෙයි... මුසවා හැර මුසවායෙන් වැළැක්කේ වෙයි... පිසුණුබස් හැර පිසුණු බසින් වැළැක්කේ වෙයි... පරොස්බස් හැර පරොස් බසින් වැළැක්කේ වෙයි... බොල් හිස් බස් බිණුම් හැර බොල් බසින් වැළැක්කේ වෙයි... මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

11. බීජසමූහ භූතසමූහ සිඳුමෙන් බිඳුමෙන් වැළැක්කේ වෙයි... අත්පා ඈ සිඳීමෙන් ද මැරීමෙන් ද රැහැන් ආදියෙන් බැඳීමෙන් ද සැහැසිකම්වලින් ද වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

12. යම්සේ වනාහි ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා නැටුම් ගැයුම්... බලසෙන් ගණිනා තැන් දක්නට යෑම් යන මෙබඳු විසුළුදස්නෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු වූ විසුළුදස්නෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

13. යම්සේ ඇතැම් මහණබමුණෝ සැදැහැයෙන් දුන් බොජුන් වළඳා අටපාකෙළිය දසපාකෙළිය... විකලාඞ්ගානුකරණය යන මෙබඳු වූ පමාවට කරුණු වූ දූකෙළියෙහි යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙබඳු වූ දූකෙළියෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

14. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... දික්සගලාපුටුව ය පලඟ ය... ඉස්දෙර පාමුලැ රතු කොට්ට තබා ඇති යහන ය යන මෙබඳු වූ උස්යහන් මහයහන් පරිහරණය කිරීමෙහි යෙදී වෙසෙත් ද, හෙ තෙමේ මේ හෝ මෙබඳු උස්යහන් මහයහන් පරිභොගයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

15. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... සුවඳ සුණුයෙන් ඇඟ ඉලීම, මනා සටහන් ගන්වනුවට තෙල්ගා මැඩීම... දික් දහවලු ඇති සුදු රෙදි හැඳීම යන ආදි ඇඟ අඩු තැන් පිරවීමටත් ඇඟ සැරසීමටත් කරුණු වන දෑ පරිභොග කිරීමෙහි යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙබඳු දෑ පරිභොග කිරීමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

16. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... රාජකථා චොරකථා... ඉතිභවාභවකථා යන මෙබඳු වූ තිරිසන් කතාවලැ යෙදී වෙසෙත් ද, හේ මේ හෝ මෙයින් අන්‍ය වූ හෝ මෙබඳු කතාවලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

17. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං විග්ගාහිකකථං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. ඉති වා ඉති එවරූපාය විග්ගාහිකකථාය පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

18. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපං දූතෙය්‍යපහිණගමනානුයොගමනුයුත්තා විහරන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං රාජමහාමත්තානං -පෙ- අමුත්‍ර ඉදං ආහරා'ති. ඉති වා ඉති එවරූපා දූතෙය්‍යපහිණගමනානුයොගා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

19. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- කුහකා ච හොන්ති -පෙ- ලාභෙන ලාභං නිජිගිංසිතාරො. ඉති වා ඉති එවරූපා කුහනලපනා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

20. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: අඞ්ගං නිමිත්තං -පෙ- මිගපක්කං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

21. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: මණිලක්ඛණං වත්ථලක්ඛණං -පෙ- මිගලක්ඛණං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

22. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: රඤ්ඤං නිය්‍යානං භවිස්සති -පෙ- ඉමස්ස පරජයො භවිස්සති. ඉති වා ඉති-එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

23. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: චන්දග්ගාහො භවිස්සති -පෙ- එවංවිපාකං චන්දිමසූරියනක්ඛත්තානං උග්ගමනං ඔග්ගමනං සඞ්කිලෙසං වොදානං භවිස්සති. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

24. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති, සෙය්‍යථීදං: සුබ්බුට්ඨිකං භවිස්සති -පෙ- ලොකායතං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

17. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... 'තෝ මේ දහම්විනය නො දනී... ඉඳින් හැකි නම් එය විසඳව'යි යන මෙබඳු උභුත් බැණ දෙඩා ගැනුම්වලැ යෙදී වෙසෙත් ද, ඒ මහණ මේ හෝ අන් මෙබඳු වූ හෝ බැණුම්දෙඩුම්වලින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

18. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... අසෝ තැනට මෙය ගෙනෙව'යි කළ නියොග පිළිගෙන රජුන්ගේ රජමහමැතියන්ගේ... මෙබඳු දූත මෙහෙවරෙහි පණිවුඩ ගෙන යැමෙහි යෙදී වෙසෙත් ද, ඒ මහණ තෙම මේ හෝ අන් මෙ වැනි වූ හෝ දූතමෙහෙවරින් පණිවුඩ ගෙනැ යැමෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

19. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... කුහක නම් කරන්නෝ චාටු බස් දෙඩන්නෝ... ලාභයෙන් ලාභය සොයන්නෝ වෙත් ද, ඒ මහණ මේ හෝ අන් මෙබඳු වූ කුහනලපන කෙරෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

20. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... අඞ්ගශාස්ත්‍රය නිමිත්ත-ශාස්ත්‍රය... මෘගපක්‍ෂය යන මේ හෝ මෙබඳු වූ හෝ තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ එයින් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

21. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... මිණිලකුණු කීම, වත් ලකුණු කීම... මූවලකුණු කීම ය යන මෙබඳු තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යා-ජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීන-විද්‍යාව කෙරෙන් මිථ්‍යාජීවය කෙරෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

22. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... රජුන්ගේ සිය නුවරින් නික්මීම වන්නේ ය... මොහුට පරාජය වන්නේ යැ යි කියන්නෝ මෙබඳු තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, හේ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වෙයි.

23. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... චන්ද්‍රග්‍රහණය වන්නේ ය... සඳහිරු නකත්තරුන්ගේ නැඟීම බැසීම කෙලෙසීම පිරිසිදු වීම මෙබඳු විපාක දෙන්නේ යැ යි කියන්නාහු මෙබඳු තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යා-ජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙම මේ හෝ මෙබඳු වූ හෝ තිරශ්චීන-විද්‍යා කෙරෙන් මිථ්‍යාජීව කෙරෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

24. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... මෙ සමයෙහි මනා වැසි වන්නේ යැ යි කීම... ලෝකායතශාස්ත්‍ර හැදෑරීම යන මෙබඳු තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, හේ මේ හෝ මෙබඳු හෝ තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

25. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථීදං: ආවාහනං -පෙ- සිරිව්හානං. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

26. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා -පෙ- එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති. සෙය්‍යථීදං: සන්තිකම්මං පණිධිකම්මං -පෙ- ඔසධීනං පටිමොක්ඛො. ඉති වා ඉති එවරූපාය තිරච්ඡානවිජ්ජාය මිච්ඡාජීවා පටිවිරතො හොති. ඉදම්පි'ස්ස හොති සීලස්මිං.

27. ස ඛො සො පොට්ඨපාද භික්ඛු එවං සීලසම්පන්නො න කුතොචි භයං පස්සති යදිදං සීලසංවරතො -පෙ- සො ඉමිනා අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො අජ්ඣත්තං අනවජ්ජසුඛං පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සීලසම්පන්නො හොති.

28. කථඤ්ච පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සො ඉමිනා අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො අජ්ඣත්තං අබ්‍යාසෙකසුඛං පටිසංවෙදෙති. එවං ඛො පොට්ඨපාද භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

29. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති. ඉධ පොට්ඨපාද භික්ඛු අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති -පෙ- තුණ්හීභාවෙ සම්පජානකාරී හොති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.

30. කථඤ්ච පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති? ඉධ පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති කායපරිහාරියෙන චීවරෙන -පෙ- සෙය්‍යථාපි පොට්ඨපාද පක්ඛී සකුණො යෙන යෙනෙව ඩෙති සපත්තභාරො'ව ඩෙති. එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු -පෙ- යෙන යෙනෙව පක්කමති සමාදායෙව පක්කමති. එවං ඛො පොට්ඨපාද භික්ඛු සන්තුට්ඨො හොති.

31. සො ඉමිනා ච අරියෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන ඉන්ද්‍රියසංවරෙන සමන්නාගතො ඉමිනා ච අරියෙන සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො ඉමාය ච අරියාය සන්තුට්ඨියා සමන්නාගතො විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං -පෙ- පලාලපුඤ්ජං. සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො නිසීදති පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා.

25. යම්සේ ඇතැම භවත් මහණබමුණෝ... ආවාහ සඳහා නකත් කීම, විවාහ සඳහා නකත් කීම... සිරිකත කැඳැවීම යන මේ හෝ අන් මෙබඳු වූ තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, ඒ මහණ තෙම මේ ද අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

26. යම්සේ ඇතැම් භවත් මහණබමුණෝ... ශාන්තිකර්ම ප්‍රණිධිකර්ම... කාරම් බේත් බැඳ වණ සුව වූ පසු ඒ ගලවා දැමීම යන මෙබඳු තිරශ්චීන-විද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් දිවි පවත්වත් ද, හේ මහණ මේ ද අන් මෙබඳු වූ ද තිරශ්චීනවිද්‍යායෙන් මිථ්‍යාජීවයෙන් වැළැක්කේ වෙයි. මේ ද ඔහුගේ ශීලයෙක් වේ.

27. පොට්ඨපාදය, ඒ මහණ මෙසේ ශීලසම්පන්න වූයේ, ශීලසංවරය හෙතු කොට නෙන කිසි ම එක ද අසංවරතායෙකින් ඇති විය හැකි බියක් නො දකී... හේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ සිය සතන්හි නිදෙස් වූ කායික චෛතසික සුවය විඳී. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම ශීලසම්පන්න වේ.

28 පොට්ඨපාදය, මහණ කෙසේ නම් ඉඳුරන්හි වැසූ දොරැත්තේ වේ ද? පොට්ඨපාදය, මෙ සස්නැ මහණ තෙම ඇසින් රුවක් දැක, එහි නිමිති නොගන්නේ වේ, අවයවයන්ගේ ආකාර සිතට නොගන්නේ වේ... මනඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. හේ මේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රියසංවරයෙන් යුක්ත වූයේ සිත්සතන්හි අව්‍යාසෙකසුඛය විඳී. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම ඉඳුරන්හි වැසූ දොරැත්තේ වෙයි.

29. පොට්ඨපාදය, කෙසේ නම් මහණ තෙම සිහිනුවණින් යුත් වේ ද? පොට්ඨපාදය, මෙහි මහණ ඉදිරියට යැමෙහි පෙරළා ඊමෙහි මනා නුවණින් දැන ම එය කරනුයේ වෙයි... නිශ්ශබ්දභාවයෙහි මනා නුවණින් දැන ම කරනුයේ වෙයි. පොට්ඨපාදය, මෙසේ වනාහි මහණ තෙම සිහිනුවණින් යුත් වෙයි.

30. පොට්ඨපාදය, මහණ තෙම කෙසේ නම් සතුටු වේ ද? පොට්ඨ-පාදය, මෙහි මහණ තෙම කායපරිහරණයට ප්‍රමාණ වූ සිවුරින්... සතුටු වූයේ වේ. පොට්ඨපාදය, යම්සේ පියාහඹනුවට තරම් අත්තටු ඇති කුරුලු තෙම යන යන තැන පියාපත් බර ඇති ව ම පියා හඹා යේ ද, පොට්ඨපාදය, එසේ ම මහණ තෙම... තමා යන යන තැනට පාසිවුරු ඈ (පැවිදි අටපිරිකර) රැගෙන ම යෙයි. පොට්ඨපාදය, මෙසේ ම මහණ තෙම සතුටු වෙයි.

31. හේ මේ ආර්‍ය්‍ය ශීලස්කන්ධයෙන් ද... මේ ආර්‍ය්‍ය ඉන්ද්‍රියසංවරයෙන් ද... මේ ආර්‍ය්‍ය සතිසම්පජඤ්ඤයෙන් ද... මේ ආර්‍ය්‍ය සන්තුෂ්ටියෙන් ද සමන්විත වූයේ, අරණ්‍යය... පිදුරුලෙනය යන යම් කිසි ජනවිවිකත සෙනසුනක් බජයි. හේ පසුබත් සෙමෙහි පිණ්ඩපාතයෙන් පෙරළා ආයේ, පලක් බැඳ උඩුකය කෙළින් පිහිටුවා, කමටහනට යොමු කොට සිහිය එළවා හිඳී.

32. සො අභිජ්ඣං ලොකෙ පහාය -පෙ- බ්‍යාපාදපදොසං පහාය -පෙ- ථීනමිද්ධං පහාය -පෙ- උද්ධච්චකුක්කුච්චං පහාය -පෙ- විචිකිච්ඡං පහාය තිණ්ණවිචිකිච්ඡො විහරති අකථංකථී කුසලෙසු ධම්මෙසු. විචිකිච්ඡාය චිත්තං පරිසොධෙති.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ඉණං ආදාය කම්මන්තෙ පයොජෙය්‍ය, තස්ස තෙ කම්මන්තා සමිජ්ඣෙය්‍යුං -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො ආබාධිකො අස්ස -පෙ- සො අපරෙන සමයෙන තම්හා ආබාධා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො බන්ධනාගාරෙ බද්ධො අස්ස, සො අපරෙන සමයෙන තම්හා බන්ධනාගාරා මුච්චෙය්‍ය සොත්ථිනා අබ්බයෙන, -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද දාසො අස්ස -පෙ- සො අපරෙන සමයෙන තම්හා දාසබ්‍යා මුච්චෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

සෙය්‍යථාපි පොට්ඨපාද පුරිසො සධනො සභොගො කන්තාරද්ධාන-මග්ගං පටිපජ්ජෙය්‍ය දුබ්භික්ඛං සප්පටිභයං, සො අපරෙන සමයෙන තං කන්තාරං නිත්ථරෙය්‍ය -පෙ- සො තතො නිදානං ලභෙථ පාමොජ්ජං, අධිගච්ඡෙය්‍ය සොමනස්සං.

එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු යථා ඉණං යථා රොගං යථා බන්ධනාගාරං යථා දාසබ්‍යං යථා කන්තාරද්ධානමග්ගං, එවං ඉමෙ පඤ්ච නීවරණෙ ධම්මෙ අප්පහීණෙ අත්තනි සමනුපස්සති. සෙය්‍යථාපි පොට්ඨපාද ආනණ්‍යං යථා ආරොග්‍යං යථා බන්ධනා මොක්ඛං යථා භුජිස්සං යථා ඛෙමන්තභූමිං, එවමෙව ඛො පොට්ඨපාද භික්ඛු ඉමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සති.

33. තස්සිමෙ පඤ්ච නීවරණෙ පහීණෙ අත්තනි සමනුපස්සතො පාමොජ්ජං[1] ජායති. පමුදිතස්ස පීති ජායති. පීතිමනස්ස කායො පස්සම්භති. පස්සද්ධකායො සුඛං වෙදෙති[2]. සුඛිනො චිත්තං සමාධියති. සො විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි, සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං[3] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා කාමසඤ්ඤා සා නිරුජ්ඣති. විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤී යෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති.[4] සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති.[5] 'අයං සික්ඛා'ති භගවා අවොච.

1. පාමුජ්ජං, PTS. 2 පටිසංවෙදෙති, ස්‍යා. 3 පඨමජ්ඣානං, සොසුවි.
4 උප්පජ්ජන්ති, PTS. 5. නිරුජ්ඣන්ති, PTS.

32. හේ ලොව ඇලීම හැර... ක්‍රොධය හැර... ථීනමිද්ධය හැර... උද්ධච්ච කුක්කුච්ච දෙක හැර... සැකය හැර තිණ්ණ සැක ඇත්තේ, කුසල් දහම්හි සැක නො කරනුයේ වෙසෙයි. සැකය කෙරෙන් සිත පිරිසිදු කෙරෙයි.

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් ණයක් ගෙන කර්මාන්ත කරන්නේ ද, ඔහුගේ ඒ කර්මාන්ත සමෘද්ධ වී නම්... ඒ කරුණින් හේ සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් ගිලන් වන්නේ ද... හේ පසු කලෙක ඒ ගිලන් බැවින් මිදෙන්නේ ද... ඒ කරුණින් හේ සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ මිනිසෙක් දඬුගෙහි බැඳුණේ වන්නේ ද, හේ පසු කලෙක ඒ දඬුගෙයින් ධන නොවිසඳ සුවසේ මිදෙන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ දාසයෙක් වන්නේ ද... හේ පසු කලෙක ඒ දාස බව කෙරෙන් මිදෙන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, යම්සේ ධනවත්, භොග ඇති මිනිසෙක් ආහාර දුර්ලභ, උවදුරු ඇති, දිය නැති දික් කතරමඟකට බස්නේ ද, හේ මෑත භාගයෙහි ඒ කතර ඉක්මැ යන්නේ ද... හේ ඒ කරුණින් සතුට ලබන්නේ ද, සොම්නසට පැමිණෙන්නේ ද,

පොට්ඨපාදය, එසේ ම මහණ තෙම ණයක් මෙන්, ලෙඩක් මෙන්, දඬුගෙයක් මෙන්, වහල්බවක් මෙන්, දුරු කතරමඟක් මෙන් ප්‍රහීණ නොවූ මේ නීවරණ පස තමා කෙරෙහි දකී. පොට්ඨපාදය, ණයින් මිදුණු බව, අරොග්‍ය බව, සිරබැඳුමෙන් මිදුණු බව, නිවහල් බව, උවදුරු නැති බිම යම්සේ ද, එසේ ම මහණ තෙම තමා කෙරෙහි ප්‍රහීණ වූ මේ නීවරණ පස දකී.

33. මේ නීවරණ පස තමා කෙරෙහි ප්‍රහීණ වූ නියා දක්නා ඔහුට සතුට උපදී. සතුටු වූවහුට ප්‍රීතිය උපදී. ප්‍රීති සිත් ඇත්තහුගේ නාම-රූප කය සංහිඳේ. සංහුන් කයැත්තේ සුව විඳී. සුවපත්හුගේ සිත එකඟ වෙයි. හේ කාමයන්ගෙන් වෙන් ව ම, අකුසල් දහමුන්ගෙන් වෙන් ව ම, විතර්කසහිත විචාරසහිත, ප්‍රීතිය හා සුඛවේදනාව හා ඇති, විවේකයෙන් උපන් ප්‍රථමධ්‍යානය ලැබැ වෙසෙසි. ඔහුගේ යම් පළමු කාමසංඥවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. එ කල්හි විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛ නැමැති සියුම් වූ සංඥව පහළ වූයේ වෙයි. එකල්හි හෙතෙම විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛසඞ්ඛ්‍යාත සුඛුම වූ සංඥ ඇත්තේ ම වේ. මෙසේ ශික්‍ෂායෙන් (ප්‍රථමධ්‍යානයෙන්) එක් (ප්‍රථමධ්‍යාන) සංඥව උපදී, ශික්‍ෂායෙන් එක් (කාම) සංඥව නිරුද්ධ වෙයි. 'මේ ශික්‍ෂා යැ'යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං[1] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා විවෙකජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා[2] සා නිරුජ්ඣති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො. සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යන්තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තතියං ඣානං[3] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා සමාධිජපීතිසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා, පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා[4] අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං[5] උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා උපෙක්ඛාසුඛසුඛුමසච්චසඤ්ඤා සා නිරුජ්ඣති. අදුක්ඛමසුඛසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. අදුක්ඛමසුඛසුඛුමසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

"පුනචපරං පොට්ඨපාද භික්ඛු සබ්බසො රූපසඤ්ඤානං සමතික්කමා පටිඝසඤ්ඤානං අත්ථඞ්ගමා නානත්තසඤ්ඤානං අමනසිකාරා 'අනන්තො ආකාසො'ති ආකාසානඤ්චායතනං උපසම්පජ්ජ විහරති. තස්ස යා පුරිමා රූපසඤ්ඤා සා නිරුජ්ඣති. ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤා තස්මිං සමයෙ හොති. ආකාසානඤ්චායතනසුඛුමසච්චසඤ්ඤීයෙව තස්මිං සමයෙ හොති. එවම්පි සික්ඛා එකා සඤ්ඤා උප්පජ්ජති. සික්ඛා එකා සඤ්ඤා නිරුජ්ඣති. අයම්පි සික්ඛා"ති භගවා අවොච.

1. දුතියජ්ඣානං, PTS. 2. විවෙකජං පීතිසුඛං සුඛුමසඤ්ඤා, PTS.
3. තතියජ්ඣානං, කොසුචි පොත්ථකෙසු. 4. අත්ථඞ්ගමා කොසුචි.
5. චතුත්ථජ්ඣානං, කොසුචි.

"තව ද අනෙකක් කියමි. පොට්ඨපාදය, මහණ තෙම විතර්කවිචාරයන්ගේ සංසිඳීමෙන් තමා තුළ සිත පහන්බව කරන, සිත එකඟබව ඇති, විතර්ක නැති, විචාර නැති, සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති, දෙවෙනි ධ්‍යානය ලැබ වෙසෙයි. ඔහුගේ විවේකයෙන් උපන් ප්‍රීතිසුඛ සඞ්ඛ්‍යාත සත්‍ය වූ යම් පළමු සංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. ඒ සමයෙහි සමාධියෙන් උපන් ප්‍රීතිසුඛසංඛ්‍යාත සියුම් වූ සත්‍ය සංඥාව වෙයි. හෙ තෙම ඒ කල්හි සමාධියෙන් උපන් ප්‍රීතිසුඛසංඛ්‍යාත සියුම් සත්‍ය සංඥා ඇත්තේ ම වෙයි. මෙසේ ශික්‍ෂායෙන් (ද්විතීයධ්‍යානයෙන්) එක් සංඥාවෙක් උපදී. එක් සංඥාවෙක් (හෙවත් ප්‍රථමධ්‍යාන සංඥාව) නිරුද්ධ වෙයි. මේ ද ශික්‍ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම ප්‍රීතිය ද දුරු ලීමෙන් උපෙක්‍ෂක ද වූයේ, සිහි ඇත්තේ, නුවණ ඇත්තේ වෙසෙයි. සුවය ද නාමකයින් විඳී. 'උපෙක්‍ෂා ඇති සිහි ඇති සුව විසුම් ඇත්තේ' යැ යි (යමක් කරණ කොට ගෙන) ආර්‍ය්‍යයෝ යම් පුගුලක්හු පවසත් ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඔහුට සමාධියෙන් උපන් ප්‍රීතිසුඛ ඇති සියුම් වූ යම් පළමු සත්‍යසංඥාවෙක් වී නම්, එය නිරුද්ධ වෙයි. ධ්‍යානොපෙක්‍ෂා සුඛය ඇති (ඖදාරිකාඞ්ග ප්‍රහීණ වූ බැවින්) සියුම් වූ සත්‍ය සංඥාව ඒ සමයෙහි වෙයි. ඒ කල්හි හේ උපෙක්‍ෂාසුඛය ඇයි සියුම් වූ සත්‍යසංඥා ඇත්තෙක් ම වෙයි. මෙසේත් ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්‍ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම කායික සුඛයාගේ ද ප්‍රහාණයෙන්, කායික දුඃඛයාගේ ද ප්‍රහාණයෙන්, පෙර ම (පළමු දෙවෙනි තෙවෙනි ධ්‍යානයන්ගේ උපචාර අවස්ථායෙහි ම) සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරු වීමෙන්, දුක් නොවූ, සුව ද නොවූ, උපෙක්‍ෂායෙන් උපන් සිහියේ පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වෙසේ. ඔහුට උපෙක්‍ෂා-සුඛය ඇති සියුම් වූ යම් පළමු සංඥාවෙක් වී ද, එය නිරුද්ධ වෙයි. දුක් ද නො වූ සුව ද නොවූ සියුම් වූ සත්‍යසංඥාව ඒ කල්හි වෙයි. ඒසමයෙහි හේ අදුඃඛ අසුඛ සූක්‍ෂම සත්‍යසංඥී ම වෙයි. මෙසේ ද ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි. මේ ද ශික්‍ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

"තව ද පොට්ඨපාදය, මහණ තෙම හැම අයුරින් ම රූපසංඥා ඉක්මීමෙන්, ප්‍රතිඝසංඥා දුරු වීමෙන්, නානාත්වසංඥා නොමෙනෙහි කිරීමෙන්, අහස අනන්ත යැ යි (කමටහන් වඩා) ආකාසානඤ්චායතන-ධ්‍යානය ලැබ වෙසෙසි. ඔහුගේ යම් පළමු රූපසංඥාවෙක් වී නම්, එය නිරුද්ධ වෙයි. ආකාසානඤ්චායතනධ්‍යාන සඞ්ඛ්‍යාත සියුම් සත්‍යසංඥාව ඒ සමයෙහි ඔහුට වෙයි. එකල්හි හේ ආකාසානඤ්චායතන සුඛසඞ්ඛ්‍යාත සියුම් සංඥා ඇත්තෙක් ම වෙයි. මෙසේත් ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් උපදී. ශික්‍ෂායෙන් එක් සංඥාවෙක් නිරුද්ධ වෙයි, මේ ද ශික්‍ෂාවෙකැ"යි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.